(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 8.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2020 සැප්තැම්බර් 11 සිකුරාදා පූ.භා. 10.30 ට**

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ 2020 සැප්තැම්බර් 22 දින සිට අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. අ.භා. 4.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උසස් නිලතල පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(1) සහ 127(1) හි විධිවිධානවල සහ 2020 සැප්තැම්බර් 08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙ හි කුමක් සඳහන්ව තිබුණ ද, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරයන් දහඅට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2020 සැප්තැම්බර් 22 අඟහරුවාදා පූ. භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

### ශෝක ප්‍රකාශ යෝජනා

අභාවප්‍රාප්ත ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.